

# ඊනියා සටන් විරාම ගිවිසුම අහෝසි කළ යුතුයි

ජනතා විමුක්ති පෙරමුණ



2005 ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා දින වූ මහින්ද චින්තනයෙන් පැහැදිලි ලෙසම බැහැර වෙමින් සිටින රජයට සහයෝගය පළකිරීම සඳහා එකඟ කරගත යුතු ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද අවම වැඩපිළිවෙලට ඇතුලත් වූ යෝජනා 20 න් එක් ප්‍රධාන යෝජනාවක් වූයේ සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම පිළිබඳව වූ යෝජනාවයි.
සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම පිළිබඳ අපගේ එම යෝජනාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිගෙන නැත. එය වත්මන් නව තත්ත්වයන් තුළ අනිවාර්යයෙන්ම කළයුතු හා කළ හැකි දෙයක් ලෙස අපි දකිමු. සටන් විරාම ගිවිසුම රටට හානිදායක එකක් ලෙස පිළිගන්නා අතරම එහි සාධනීය පැත්තක් දකින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යෝජනා කර ඇත්තේ එහි රටට අහිත කර කොන්දේසි ඉවත් කර එය යළිත් සකස් කිරීමට පියවර ගතයුතු බවය. සටන් විරාම ගිවිසුම කවර අඩුපාඩුකම් මැද වුවද ලංකාවට අදාළ දේශීය හා විදේශීය පෙලගැසීම්වල සාධනීය පිළිගැනීමකට ලක්ව ඇතැයි කීම අපට නම් විමතියට කරුණකි. මෙම ගිවිසුම අත්සන් කළ දිනවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ඒ පිළිබඳ කළ පුළුල් සහ සැබෑ විවේචනය අදටත් වලංගු නම් මෙවන් සිතීමකට යා හැකි යයි අපි නොසිතමු. අපගේත් ශ්‍රී ලංකාවේ බහුතර ජනතාවගේත් ස්ථාවරය නම් සටන් විරාම ගිවිසුම ශ්‍රී ලංකාවට මර උගුලක් වී ඇති බවය. අනෙක් අතට සටන් විරාම ගිවිසුමේ සාධනීය පැති තිබුනේ නම් ජනාධිපතිවරණයේ ප්‍රතිඵලද මීට වඩා මුළුමනින්ම වෙනස් විය හැකිව තිබූ බවද සිහිපත් කළ යුතුය.
ඊනියා සටන් විරාම ගිවිසුම මේ වනවිට ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට, ස්වාධීනත්වයට, භෞමික අඛණ්ඩතාවයට, ඒකීයභාවයට හා ජාතික ආරක්ෂාවට කර ඇති බරපතළ හානිය අනුවත්, තවදුරටත් එසේ පැවතීම නිසා අනාගතයේදී ශ්‍රී ලංකාව කැඩී බිඳී විසිරී යාම අනිවාරනීය වීම ගැනත් යථාර්ථවාදීව සිතන්නේ නම් දැන් දෙගිඩියාවකින් තොරව මෙම ගිවිසුම වහාම අහෝසි කළ යුතු තීරණාත්මක සන්ධිස්ථානයකට අපි එළඹ සිටිමු.
මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද අවම වැඩපිළිවෙළට එවා තිබූ පිළිතුරු ලිපියේ 3 වන පිටුවේ අවසාන ඡේදයේ කවර හෝ සටන් විරාමයක් තිබීම අත්‍යවශ්‍ය බව පෙනේ යනුවෙන් සඳහන් වේ. සටන් විරාම පිළිබඳව සලකා බලන විට ඒවා බොහොමයක් තිබිය හැකිය. එහෙත් ඒවා අතරින් අප පිළිගත යුත්තේ අර්ථාන්විත සටන් විරාමයක් පමණි. ජිනීවා සාකච්ඡාවලට ආණ්ඩුව සහභාගි වූයේද අර්ථාන්විත සටන් විරාමයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවය ඇතිවය.
2002 පෙබරවාරි 22 වැනිදා අත්සන් කෙරුණු ඊනියා සටන් විරාම ගිවිසුම ජනතා විමුක්ති පෙරමුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පලවා හැරීමේ හෝ ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමේ වුවමනාව නිසා නොවේ. එම ගිවිසුම පළමු වරට ලිඛිතව කොටි පාලන ප්‍රදේශ යනුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කොටි සංවිධානයට පවා දුන් බැවිනි. ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, ඒකීයභාවය උල්ලංඝනය කළ බැවිනි. එම ගිවිසුම ශ්‍රී ලංකාවේ මූලික නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළ බැවිනි. මිලිටරි බල තුලනය කොටි සංවිධානයේ වාසියට හැරවීමට මේ ගිවිසුමට හැකි වූ බැවිනි. කොටි සංවිධානයට රාජ්‍ය තාන්ත්‍රිකභාවය එමගින් ලබාදුන් බැවිනි. අදවන විට කොටි සංවිධානයට යාවත්කාලින දෙමළ ඊළාම් රාජ්‍යයක පැවැත්ම සඳහන් කර ප්‍රකාශ නිකුත් කිරීමට එමගින් හැකියාව ලබාදී ඇති බැවිනි. සටන් විරාම ගිවිසුම බරපතළ ලෙස උල්ලංඝණය කරමින් වුවද කොටි සංවිධානය සටන් විරාම ගිවිසුමෙන් ඉවත් නොවී සිටින්නේ එම ගිවිසුම අක්‍රිය ලෙස පවතිත්දී පවා ඔවුන්ට දිනපතා වාසි අත්වන බැවිනි. සටන් විරාම ගිවිසුමට කල් ගතවන තරමට එමගින් කොටි සංවිධානයට ලබාදී ඇති අර්ධ නෛතික පිළිගැනීම පූර්ණ නෛතික පිළිගැනීමක් බවට පත්වන බව ඕනෑම කෙනෙකුට වැටහී යායුතුව ඇත. එම අනතුර පිළිබඳව ලංකාවේ නීති විශාරදයකු වන ජනාධිපති නීතිඥ එච්. එල්. ද සිල්වා මහතා මෑතක දී ඉතා වැදගත් අදහස් පළකර තිබූ බවද මෙහිලා සඳහන් කළ යුතුය.
එසේම සටන් විරාම ගිවිසුම ඉන්දු - ලංකා ගිවිසුම සමඟ සංසන්ඳනය කිරීමද නිවැරදි නොවේ. සරල ලෙස ගත්තද ඉන්දු-ලංකා ගිවිසුමට කල්පිරීම නිසා ඊනියා දෙමළ ඊලාම් රාජ්‍යයකට පූර්ණ නෛතික පිලිගැනීමක් සිදුවන්නේ නැත. ඉන්දු-ලංකා ගිවිසුම නිසා සිදුවූ හා සිදුවිය හැකි හානි පිළිබඳව වෙනම කතා කළ යුතුය. එහෙත් ඊනියා සටන් විරාම ගිවිසුමට කල් පිරෙමින් නොකඩවා දිගටම පැවතීම කොටින්ගේ වෙනම රාජ්‍යය පිළිබඳ උවමනාව ඉටුකිරීමට හේතු වන්නකි. අප සටන් විරාම ගිවිසුම වහාම නිල වශයෙන් අහෝසි කළයුතු යැයි දැඩිව විශ්වාස කරන්නේ එම අනතුරුදායක තත්ත්වය නිසාමය.
කොටි සංවිධානය ආරක්ෂක හමුදා, පොලිස් භටයන් හා නිලධාරීන් මරා දමද්දීත් අත් දෙක පිටුපසට බැඳ දමා තිබුන තත්ත්වයකට රටේ නීත්‍යානුකූල හමුදා හා පොලීසිය බාල්දු කර තිබුණු ගිවිසුමකට හමුදාවේ කැමැත්ත හෝ අනුමැතිය තිබේ යැයි ප්‍රකාශ කිරීම කිසිවෙකුට හෝ විශ්වාස කළ නොහැක. නීත්‍යානුකූල හමුදාවේ තත්ත්වය සැබෑ ලෙසම එය නම් ජනාධිපතිතුමා හා ආණ්ඩුව වහාම එම තත්ත්වය වෙනස් කළ යුතුය. හමුදාව හා පොලීසිය රටේ දේශසීමා රැකගත හැකි පරිදි ස්වෛරීත්වය, ඒකීයභාවය, ජාතික සමඟිය, නීතිය විධානය ක්‍රියාවට නැංවිය හැකි පරිදි මානසික වශයෙන් ද, ද්‍රව්‍යමය වශයෙන් ද, ඉහළ නැංවිය යුතුය.
අනෙක් අතට කොටි සංවිධානය සටන් විරාම ගිවිසුම අමු අමුවේ උල්ලංඝණය කරමින්මහා පරිමාණයෙන් උත්සන්න කර ඇති ත්‍රස්තවාදී ක්‍රියාදාමය හමුවේ එකී ගිවිසුම යථාර්ථය තුල අවලංගු වී ඇත. මියැදුන එකී ගිවිසුම දැන් යළි සකස් කිරීමට නොහැකිය. එබැවින් කළයුත්තේ මියැදුන එකී ගිවිසුමෙන් නිල වශයෙන් ඉවත්වීම මිස, එය සංශෝධනය කිරීමට කාලය වැය කිරීම නොවේ.
ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය සාකච්ඡා මාර්ගයෙන් විසඳාගත යුතු බවත් ඊට නිවැරදි විද්‍යාත්මක දේශපාලන විසඳුමක් ලබාදිය යුතු බවත් ඊට සමගාමීව ත්‍රස්තවාදය පරාජය කළ යුතු බවත් දැඩිව විශ්වාස කරන අපි ඒ සඳහා දේශපාලන ක්‍රියාවලියක වුවමනාව පිළිගනිමු. එහෙත් එම වුවමනාව ඉටුකිරීම සඳහා 2002 සටන් විරාම ගිවිසුමට කල හැකි කිසිවක් ඉතිරි වී නැති බව දැනටමත් හොඳහැටි ඔප්පු වී තිබෙන බවද අපි දනිමු. මහින්ද රාජපක්ෂ මහතා හා ජනතා විමුක්ති පෙරමුණ අතර අත්සන් කෙරුණු ප්‍රතිපත්තිමය සම්මුතියේ 04 වන වගන්තියට අනුව සටන් විරාම ගිවිසුමේ ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට හා ඒකීයභාවයට හානිකර වගන්ති ඉවත් කර ගිවිසුම යළි සකස් කිරීමට එකඟ වී තිබූ අතර මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 31 වන පිටුවේ කිසිදු ත්‍රස්ත ක්‍රියාවකට ඉඩ නොලැබෙන පරිදි සටන් විරාම ගිවිසුම යළි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ යනුවෙන් ද සඳහන් විය. එහෙත් ජනාධිපතිවරණයෙන් පසු මාස 09 ක් ගතවී තිබියදීත් සටන් විරාම ගිවිසුම යළි සකස් කිරීම කිසිදු පියවරක් ගැනීමට ආණ්ඩුව අපොහොසත් වී ඇත. ජිනීවා සාකච්ඡා වලදී අර්ථාන්විත සටන් විරාමයක් නිර්මාණය කර ගැනීම සඳහා බලාපොරොත්තු තබා සිටියද එම සටන් විරාම ගිවිසුමට ගරු කරන බවටත් එය ආරක්ෂා කරන බවටත් ජිනීවා සාකච්ඡා අවසානයේදී නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශනයට අත්සන් තබමින් ආණ්ඩුව එකඟ විය. එසේම ඉන්පසු කිහිපවිටකදීම සටන් විරාම ආරක්ෂා කරන බව ආණ්ඩුවේ වගකිව යුතු බොහෝදෙනා පැවසූහ. සටන් විරාම ගිවිසුම යළි සකස් කිරීම සිදු නොවිණි. එහෙත් එය ආරක්ෂා කරන බව නම් කියැවිණි. දැන් සටන් විරාම ගිවිසුම යළි සකස් කිරීම අර්ථ විරහිතය. අලුත් දේශපාලන තත්ත්වය විසින් එය නිල වශයෙන් අහෝසි කළ යුතු බව අනිවාර්ය කරනු ලැබ ඇත. ඒ අනුව මෙම සටන් විරාම ගිවිසුම විසින් රටට මුහුණදීමට සිදුකරන ලද සැබෑ අනතුර ඇති සැටියෙන් වටහා ගන්නේ නම් එය අහෝසි කිරීමට ක්‍රියා කිරීම හැර වෙනත් විකල්පයක් ඉතිරි වී නැත.
කෙසේ වෙතත් කොටි සංවිධානයේ ත්‍රස්තවාදී ප්‍රහාරවලට ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට ජනාධිපතිතුමා ගෙන ඇති පියවර අගය කරන අපි එම පියවර අංග සම්පූර්ණ හා වඩා ප්‍රතිඵලදායක කර ගැනීම සඳහා මෙම ගිවිසුම අහෝසි කර ජනාධිපතිතුමාට හා නීත්‍යානුකූල ආණ්ඩුවට පැනවී ඇති සීමා තහංචි වලින් මිදීම අවශ්‍ය යැයි අපි යළිත් අවධාරණය කරමු.

**ජනතා විමුක්ති පෙරමුණ**
ජාත්‍යන්තර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
මෙල්බර්න් - ඔස්ට්‍රේලියාව




